රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 20/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.06.15 වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය සේවයේ ලිපිකාර හා සමාන්තර සේවාවන්හි ඌණ සේවා නියුක්ත උපාධිධාරීන්ට සහන සැලසීම සහ 1971 - 1976 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවා ගනු ලැබූ නිලධාරීන්ට සහන සැලසීම.

රාජ්‍ය සේවයේ ඌණ සේවා නියුක්ත උපාධිධාරීන්ට පහත දක්වෙන පරිදි සහන සැලසිය යුතු යයි 1994 මැයි මස 11 වෙනි දින රජය තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි සහන සැලසිය යුතු වේ.

02. (අ) 1971 සිට 1976 අතර බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ඔවුනට යෝග්‍ය තනතුරු සොයා දෙනු ලබන තෙක් ඔවුනට පෞද්ගලික වනසේ සහ තාවකාලික පියවරක් වශයෙන් එස් : 5 : 1 වන රු: 49200 - 12 x 1560 - 72600 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ 1994.06.01 දින සිට පිහිටුවීමට.

(ආ) (I) 1971 ට පෙර සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරී තනතුරු වලට සමාන්තර තනතුරු වලට බඳවාගත් උපාධිධාරීන්.

(II) 1971 - 1977 අතර බඳවාගත් අභ්‍යාසලාභීන් නොවන උපාධිධාරීන්,

(III) 1977 ට පසු උපාධිධාරී ස්ථාපන සේවය යටතේ බඳවාගත් වසර 15 කට වඩා වැඩි සේවා කාලයක් ඇති උපාධිධාරීන්,

මොවුනට පෞද්ගලික වනසේ සහ තාවකාලික පියවරක් වශයෙන් යෝග්‍ය තනතුරු සොයා දෙනු ලබන තේක එස් : 3 : 8 වන රු: 45120 - 10 x 1200 - 57120 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ 1994.06.01 දින සිට පිහිටුවීමට.

03. 1980 දෙසැම්බර් මස 31 දින දක්වා ලිපිකරු හා සමාන්තර සේවාවන්ට පත්ව, ඒවායේ මාණ්ඩලික තනතුරු නොදරන ඌණ සේවා නියුක්ත උපාධිධාරීන්ට ඔවුන්ගේ සුදුසුකම් වලට සරිලන රැකියා අවස්ථා සලසා දීම සඳහා රැකියා සැපයීමේ විශේෂ වැඩපිළිවෙලක් ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ ආරම්භ කරනු ඇත.

04. 1970 සිට 1982 දක්වා කාලය තුළ උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය හා උපාධිධාරී ස්ථාපන සේවය යටතේ රැකියා අවස්ථා සලසන ලද තනතුරු සඳහා වන පුරප්පාඩු වලින් 50% ක් අදාල ඌණ සේවා නියුක්ත උපාධිධාරීන් සඳහා වෙන් කළ යුතු වේ. එසේ රැකියා අවස්ථා සැලසීමේදී මෙම උපාධිධාරීන් දැනට දරණ තනතුරට පත්වූ දිනය හෝ උපාධිය සමත්වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය අනුව රැකියා ලබා දීමේ ප්‍රමුඛතා අනු පිළිවෙළ නිශ්චය කළ යුතුය.

05. රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා අවස්ථා සලසා දීම සඳහා විධිවිධාන සලසනු ලබන අවස්ථාවලදී 1980 දෙසැම්බර් මස 31 වැනි දිනට පසුව බඳවා ගනු ලැබූ ලිපිකරු හා සමාන්තර සේවාවන්හි ඌණ සේවා නියුක්ත උපාධිධාරීන්ගේ අයඳුම් පත් ද 4 වන වගන්තියේ විධි විධාන අනුව සලකා බැලිය යුතුය.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙණිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.